# පාසල් අධ්‍යාපනය අතරමඟදී හැරයාමට බලපාන හේතු පිළිබඳව අධ්‍යයනයක්

(වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගල්ගමුව ප්‍රදේශය ඇසුරින් )

එච්.ජී. කෝලිත නිශ්ශංක බණ්ඩාර, එච්. කේ. උදයාංග,
ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය
අලෙවි කළමණාකරණ අධ්‍යයන අංශය, කැලණිය විශ්ව විද්‍යාලය, කැලණිය.

## ABSTRACT

රටක දරුවන්ට අධ්‍යාපනය ලබාදීම යනු එම රටේ අනාගත අභිවෘද්ධිය වෙනුවෙන් සිදුකරන නිවැරැදි ආයෝජනයකි. ශ්‍රී ලංකාවේ විවිධ පළාත්, දිස්ත්‍රික්ක සමීක්ෂණයකට භාජනය කළවිට අධ්‍යාපනය ලැබීමේ හා අධ්‍යාපනය ලබාදීමේ විෂමතා පවතින ආකාරයක් දෘශ්‍යමාන වේ. වර්තමානය වනවිට ශ්‍රී ලංකාවේ සාක්ෂරතාවය 91.3 % කි. එය ස්ත්‍රී පුරුෂ ලෙස ගතහොත් පුරුෂ 92.8 % ක් ලෙසද ගැහැණු 90.0 % වේ. ශ්‍රී ලංකාවේ 2008 වර්ෂයේ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 4,101,000 ක් වූ අතර එය 2009 වනවිට 4,032,000 ක් දක්වා අඩුවී ඇත. විශේෂයෙන්ම කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගල්ගමුව ප්‍රදේශයන්හි දරුවන් විවිධ හේතූන් මත අධ්‍යාපනයෙන් ඉවත්වීමක් දක්නට ලැබේ.

මෙම අධ්‍යයනයේ අරමුණ වූයේ නිදහස් අධ්‍යාපනය තුළ වුවද ළමුන් අතරමඟදී පාසල් හැරයාමට හේතුවන සමාජ හා ආර්ථික සාධකයන් පිළිබඳව පර්යේෂණාත්මක විග්‍රහයක් සිදුකිරීමයි. පර්යේෂණය සඳහා ප්‍රාථමික සහ ද්විතීක දත්ත භාවිතා කරන ලදි. ගල්ගමුව ප්‍රදේශය ඇසුරින් තෝරාගන්නා ලද අපොස සාමාන්‍ය පෙළ පන්තියට පැමිණීමට පෙර, අධ්‍යාපනයෙන් ඉවත් වූ ප්‍රතිචාරකයින් 100 ක් සඳහා ව්‍යුහගත ප්‍රශ්නාවලියක් ලබාදීම මඟින් ප්‍රාථමික දත්ත ලබා ගන්නා ලදි. ද්විතීක දත්ත වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව, පුවත්පත්, සඟරා, මේ සම්බන්ධයෙන් පලවී ඇති පොත්පත්, නිබන්ධන ආදිය භාවිතා කළ අතර යෝග්‍ය පරිදි විස්තරාත්මක සංඛ්‍යානමය විශ්ලේෂණ ක්‍රම උපයෝගී කරගනිමින් විශ්ලේෂණය කරණ ලදි.

අධ්‍යයනයෙන් හෙලිවූ කරුණු වූයේ පවුලේ අඩු ආදායම් මට්ටම නිසා 55% ක් ද, අධ්‍යාපනය ලැබීමට ඇති අකමැත්ත නිසා 15% ද, අඩු වයසින්ම විවිධ රැකියා සඳහා යොමුවීම සහ පවුලේ ගොවිතැන් කටයුතු වලට යොමුවීම නිසා 22% ද, පාසල්වල අඩු පහසුකම්, ගුරුවරුන් නොමැති නිසා 03% ක් සහ වෙනත් විවිධ කරුණු නිසා 05% ක්ද පාසල අතහැර යන තත්ත්වයක් පෙන්නුම් කරණ ලදි.

මෙම අධ්‍යයනය තුළින් නිගමනය කලහැකි වූයේ ආර්ථික ප්‍රශ්න නිසා පාසල් හැරයාමේ වැඩි ප්‍රවනතාවයක් පවතින බවයි.

මූලපද. සාක්ෂරතාව, අනාගත අභිවෘද්ධිය, සමාජ හා ආර්ථික සාධක, නිදහස් අධ්‍යාපනය, අධ්‍යාපනය හැරයාම.